# චිත්‍ර කලා ඉගෙනුම් අත්වැල

**අ. පො. ස. (සාමාන්‍ය පෙළ) චිත්‍ර විෂය ප්‍රතිඵල ඉහල නැංවීමේ වැඩසටහන**

සෞන්දර්ය අංශය

කෑගල්ල අධ්‍යාපන කලාපය

## චිත්‍ර කලා ඉගෙනුම් අත්වැල

**අ. පො. ස. (සාමාන්‍ය පෙළ) චිත්‍ර විෂය ප්‍රතිඵල ඉහල නැංවීමේ වැඩසටහන**


**උපදේශකත්වය සහ මෙහෙය වීම**
**සහකාර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/අධ්‍යාපන සංවර්ධන**

ජී. පී. සී. ධර්මසේන මිය

**සහකාර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/සෞන්දර්ය**
ඩබ්. එස්. එෆ්. කරුණාරත්න මිය

**උපදේශකත්වය සහ මග පෙන්වීම**
චිත්‍ර කලා ගුරු උපදේශිකා (කෑගල්ල අධ්‍යාපන කලාපය)

කේ. ඒ. ප්‍රියන්ති රේණුකා මිය

**සංස්කරණය**

මහින්ද රාජපක්ෂ මයා
කෑ/බණ්ඩාරනායක මහා විද්‍යාලය

පී. ඩී. ටී. ඉන්ද්‍රචාපා මෙය
කෑ/වර/අල්ගම මහා විද්‍යාලය

**පිටකවරය සහ පරිගණක පිටු සැලැසුම**

මහින්ද රාජපක්ෂ මයා
කෑ/බණ්ඩාරනායක මහා විද්‍යාලය



**ප්‍රකාශනය**

© කෑගල්ල අධ්‍යාපන කලාපය

**මුද්‍රණය**

## සෞන්දර්ය අධ්‍යක්ෂ තුමියගේ පණිවිඩය

අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා සූදානම් වන චිත්‍ර විෂය හදාරන දූවා දරුවන්ට විභාග අභියෝගය සාර්ථකව ජය ගැනීම සඳහා සම්පාදිත මෙම කෘතිය කාලෝචිත ක්‍රියාකාරකමකි.

මෙහි චිත්‍ර විෂය නිර්දේශය හා සබැඳි සියලු ම ඡායාරූප අඩංගුවන අතර පාරිභාෂික වචන මාලාවෙන් කොටසක් ද ආවරණය කර ඇත. එම නිසා අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී බහුවරණ ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 35 කටත් ඉතිරි ප්‍රශ්න පහ වන පාරිභාෂික වචන ආශ්‍රයෙන් පිළිතුරු සැපැයීමටත් දරුවනට පහසු වනු ඇත. මේ නිසා දරුවාගේ ධාරණ ශක්තිය වඩාත් වර්ධනය වනු ඇත.

මෙම කෘතිය එළි දැක්වීම තුළින් චිත්‍ර විෂය හදාරන දරුවන්ගේ විෂය සාධන මට්ටම ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමට හා විභාග ප්‍රතිඵල ඉහළ නංවා ගැනීමටත් හැකිවේවා යන්න මගේ පැතුමයි.

මෙම මහඟු කාර්යය මල්ඵල ගැන්වීමෙහිලා තම දැනුම හා කාලය නොමසුරුව ලබා දුන් අප කලාපයේ චිත්‍ර විෂය භාර ගුරු උපදේශක ප්‍රියන්ති රේණුකා මහත්මියටත් චිත්‍ර විෂය භාර ගුරු ඇදුරු මඩුල්ලටත් මාගේ හෘදයාංගම ස්තුතිය පිරිනමමි.

ඩබ්. එස්. එෆ්. කරුණාරත්න,

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය),
කලාප අධයාපන කාර්යාලය,
කෑගල්ල.
2020.12.09

# හැඳින්වීම

වර්තමාන පාසල් පද්ධතිය තුළ ඇති කාණ්ඩ විෂයයන් අතරින් සිසුනට පෙළපොතක් නොමැති විෂයක් ලෙස චිත්‍ර විෂය දැක්විය හැක.

ගුරු මාර්ගෝපදේශ වල එන උදාහරණ සිතුවම් සෑම දරුවෙකු අතට ම පත්කරවීමේ ප්‍රායෝගික ගැටලු චිත්‍ර කලා විෂය උගන්වන ගුරුවරුනට පවති. එබැවින් සිසුන් චිත්‍ර විෂයට අවම ලකුණු ලබා ගන්නා අවස්ථා අගැයීම් වලදී හඳුනාගෙන ඇත. ගුරු මාර්ගෝපදේශ වල ඇති සියලුම රූප සටහන් එක් පොතකට කැටිකොට සිසුන් අතට පරිශීලනයට පත්කර චිත්‍ර විෂයේ ප්‍රතිඵල සාධනය ඉහල මට්ටමකට ගෙන ඒමේ පහන් සිතුවිල්ලක ප්‍රතිඵලයක් ලෙස මෙම ග්‍රන්ථය ඔබ අතට පත්වේ.

අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ දී තම විෂය තෝරාගැනීම් අනුව චිත්‍ර විෂය හදාරන සිසුනට ද විශ්වවිද්‍යාල තුළ විවිධ පාඨමාලා සඳහා ඉදිරිපත් වීමට වර්තමානයේ අවකාශ පුළුල් වී ඇති බව සතුටින් ප්‍රකාශ කළ හැක. මෙම ග්‍රන්ථය පරිශීලනය කරමින් ඔබට ඉහළ සාමාර්ථයක් ලබා ගැනීමට හැකිවනු නිසැක ය. තව ද මෙමගින් ඉගෙනුම් ඉගැන්වීම් වලදී ගුරු සහ සිසුනට එම කාර්යය සාර්ථකව ඉටුකර ගැනීමට පිටුවහලක් වනු ඇත.

මෙම ග්‍රන්ථයෙහි පිටු සැකැසීම, පරිගණක අක්ෂර සංයෝජනය සහ පිට කවරය නිර්මාණය සඳහා දායක වූ කෑ/බණ්ඩාරනායක මහා විද්‍යාලයේ චිත්‍ර කලා ආචාර්ය මහින්ද රාජපක්ෂ මහතා සහ මෙම ග්‍රන්ථයේ නිර්මාණ සංකල්පය සහ පාරිභාෂික වචන මාලාව සකස් කළ කෑ/වර/අල්ගම මහා විද්‍යාලයේ චිත්‍ර කලා ආචාරිණී පී. ඩී. ටී. ඉන්ද්‍රචාපා මෙනවියට මාගේ ගෞරවාදර ස්තුතිය පුද කරමි.

කේ. ඒ. ප්‍රියන්ති රේණුකා,

චිත්‍ර කලා ගුරු උපදේශිකා,
කෑගල්ල අධ්‍යාපන කලාපය,
2020.12.09

## පටුන

**1.** 10-11 විෂය නිර්දේශයට අයත් සම්පූර්ණ ඡායාරූප පෙළ............................................................ 1-28
**2.** චිත්‍ර කලා පාරිභාෂික වචන මාලාව ...................................................................................... 29-32
**3.** ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය ....................................................................................................... 33-33
ඇමිණුම 1 අ. පො. ස. (සාමාන්‍ය පෙළ) 2018 ප්‍රශ්න පත්‍රය
ඇමිණුම 2 අ. පො. ස. (සාමාන්‍ය පෙළ) 2019 ප්‍රශ්න පත්‍රය




**පියුම් පිට වැඩීම**, එම්. සාර්ලිස් ශිල්පියා, 20 වන සියවසේ බෞද්ධ කලාව.



**සිදුහත් කුමරු සහ මව් බිසව**, එම්. සාර්ලිස් ශිල්පියා, ලිතෝ මුද්‍රණ ක්‍රමයෙන් පිටපත් කරන ලද චිත්‍රයකි.



**හේමමාලා සහ දන්ත කුමරු**, සෝලියස් මැන්දිස් ශිල්පියා, කැලැණි විහාරය.



**සංඝමිත්තා තෙරණිය ජය ශ්‍රී මහා බෝධිය වැඩම කරවීම**, සෝලියස් මැන්දිස් ශිල්පියා, කැලැණි විහාරය.



**තුන් ඇඳුතු කුලුණු**, ගඩලාදෙණිය විහාරය, ගම්පොළ යුගය, ක්‍රි. ව. 1341-1351



**ගඩලාදෙණිය විහාරය**, ගම්පොළ යුගය, ගණේශ්වරාචාර්ය ශිල්පියාගේ නිර්මාණයකි.



**විජයොත්පාය**, ගඩලාදෙණිය විහාරය, ගම්පොළ යුගය, ක්‍රි. ව. 1341-1351



හිඳි බුද්ධ ප්‍රතිමාව, ගඩලාදෙණිය විහාරය, හින්දු ප්‍රතිමා කලාවේ ලක්ෂණ, මකර තොරණ හඳුනාගත හැක.




**ලංකාතිලක විහාරය**, ගම්පොළ යුගය, ස්ථපතිරායර් ශිල්පියාගේ නිර්මාණයකි, ක්‍රි. ව. 1341-1352



හිඳි බුද්ධ ප්‍රතිමාව, ලංකාතිලක විහාරය, හින්දු ප්‍රතිමා කලාවේ ලක්ෂණ, මකර තොරණ හඳුනාගත හැක.



**සැරැසිලි මෝස්තර**, ලංකාතිලක විහාරය



**සිව් හංස පූට්ටුව**, ලංකාතිලක විහාරය



**කෝණාගම බුද්ධ**, සූවිසි බුදුවරු, ලංකාතිලක විහාරය



**ඇම්බැක්කේ දේවාලය**, දෙල්මඩ මූලාචාරීන්ගේ නිර්මාණයකි, ගම්පොළ යුගය, 14 වන ශත වර්ෂය



**මඩොල් කුරුපාව**, ඇම්බැක්ක දේවාලය, පරාල 26 ක් තනි ලී ඇණයකින් සම්බන්ධ කර ඇත.



**භේරුණ්ඩ පක්ෂියා**, ඇම්බැක්ක දේවාලයේ පනේල කැටයමකි.



**කිඳුරි**, ඇම්බැක්ක දේවාලයේ පනේල කැටයමකි.



**පේකඩ නිර්මාණ**, ඇම්බැක්ක දේවාලය



**වෘෂභ කුඤ්ජරය**, ඇම්බැක්ක දේවාලයේ පනේල කැටයමකි.



**හංස පූට්ටුව**, ඇම්බැක්ක දේවාලයේ පනේල කැටයමකි.



**සිංහයා**, ඇම්බැක්ක දේවාලයේ පනේල කැටයමකි.



**බිනර මල**, ඇම්බැක්ක දේවාලයේ පේකඩ කැටයමකි.



**ලියකම් මෝස්තර**, ඇම්බැක්ක දේවාලයේ පනේල කැටයමකි.



**නළඟන**, ඇම්බැක්ක දේවාලයේ පනේල කැටයමකි.



**දරුවාට කිරිපොවන මව**, ඇම්බැක්ක දේවාලයේ පනේල කැටයමකි.



**මල්ලව පොරය**, ඇම්බැක්ක දේවාලයේ පනේල කැටයමකි



**දේශීය හේවායා**, ඇම්බැක්ක දේවාලයේ පනේල කැටයමකි.



**විදේශීය හේවායා**, ඇම්බැක්ක දේවාලයේ පනේල කැටයමකි.



**රබන් වයන්නා**, ඇම්බැක්ක දේවාලයේ පනේල කැටයමකි.




**ශ්‍රී දළඳා මාළිගය**, පත්තිරිප්පුව දේවේන්ද්‍ර මූලාචාරීන්ගේ නිර්මාණයකි, මහනුවර යුගය, ක්‍රි. ව. 1687-1707



**ත්‍රිකෝණාකාර හැඩති සඳකඩ පහණ**, ශ්‍රී දළඳා මාළිය, මහනුවර යුගය.



**දෙගල්දොරුව ලෙන් විහාරය**, දෙවරගම්පොළ සිල්වත් තැන, කොස්වත්තේ සිත්තර නයිදේ සහ නීලගම පටබැන්ඳා සිතුවම් ඇඳ ඇත, මහනුවර යුගය, ක්‍රි. ව. 1747-1782



**මාර පරජය**, දෙගල්දොරුව විහාරය



**වෙස්සන්තර රජු ඇළි ඇතු දන්දීම**, දෙගල්දොරුව විහාරය



**කුෆූ පිරමීඩය**, ඊජිප්තු වාස්තු විද්‍යාව, ක්‍රි. පූ. 2440



**මහා ස්පින්කස්**, කල්පිත මූර්ති, ඊජිප්තු කලාව



**ස්ක්‍රයිබ්**, ඊජිප්තු කලාව



**නෙපර්ටිටි**, ඊජිප්තු කලාව



**මීඩම් හී පාත්තයෝ**, ඊජිප්තු කලාව



**කුරුලු දඩයම**, ඊජිප්තු කලාව, ක්‍රි. පූ. 1580-1350 කාලයට අයත් බව සැලැකේ.





**කුරුලු දඩයම (ක්ෂුද්‍ර අංග)**, සතුන්ගේ ක්‍රියාකාරී ඉරියව් ප්‍රකාශ වේ, සතුන්ගේ රූප ස්වභාවිකව ඇඳීමට උත්සාහ කර ඇත.



**මාරපරාජය**, ජෝර්ජ් කීට් ශිල්පියා, හින්දු සහ ගණිකවාදී කලා ලක්ෂණ, බොරැල්ල ගෝතමී විහාරය.



**මාරපරාජය (ක්ෂුද්‍ර අංග)**, බොරැල්ල ගෝතමී විහාරය.



**නායිකා චිත්‍ර**, ජෝර්ජ් කීට්, ගණිකවාදී ලක්ෂණ සහ තන්ත්‍රයානික ලක්ෂණ.



**නායිකා චිත්‍ර**, ජෝර්ජ් කීට් ශිල්පියා, ගණිකවාදී ලක්ෂණ සහ තන්ත්‍රයානික ලක්ෂණ.




මැදවෙල **ටැම්පිට විහාරය**, මහනුවර යුගයේ විහාර කලාව



**බිතු සිතුවම්**, මැදවෙල ටැම්පිට විහාරය, මහනුවර සිතුවම් සම්ප්‍රදාය




**වෙස්සන්තර ජාතකය**, මැදවෙල ටැම්පිට විහාරය, මහනුවර සිතුවම් සම්ප්‍රදාය



**අවසන් භෝජන සංග්‍රහය**, ලියනාර්ඩෝ දා වින්සි ශිල්පියා, පුනරුද යුගයේ චිත්‍ර කලාව.




**පර්වත මස්තකයේ දේව මෑණියෝ**, ලියනාර්ඩෝ දා වින්සි ශිල්පියා, පුනරුද යුගයේ චිත්‍ර කලාව.



**ආදම් මැවීම**, මයිකල් ආන්ජලෝ ශිල්පියා, පුනරුද යුගයේ චිත්‍ර කලාව.



**මොනාලීසා**, ලියනාර්ඩෝ දා වින්සි ශිල්පියා.



අන්තිම විනිශ්චය, මයිකල් ආන්ජලෝ ශිල්පියා, පුනරුද අවධියේ චිත්‍ර කලාව



පියෙටා, මයිකල් ආන්ජලෝ ශිල්පියා, පුනරුද යුගයේ මූර්ති කලාව.



පියෙටා, මයිකල් ආන්ජලෝ ශිල්පියා, පුනරුද අවධියේ මූර්ති කලාව.



ඬේවිඩ්, මයිකල් ආන්ජලෝ ශිල්පියා, පුනරුද අවධියේ මූර්ති කලාව




තණ පිටියේ මැඩොන්නා, රෆායෙල් සන්තියෝ ශිල්පියා, පුනරුද අවධියේ චිත්‍ර කලාව



ඇතැන්ස් ගුරු කුලය, රෆායෙල් සන්සියෝ ශිල්පියා, පුනරුද අවධියේ චිත්‍ර කලාව.



මැඩොන්නා ඩෙලා සේදියා, මයිකල් ආන්ජලෝ ශිල්පියා, පුනරුද අවධියේ චිත්‍ර කලාව.



වීනස් දී මීලෝ, ඇලෙක්සැන්ඩ්‍රොස් ශිල්පියා, ග්‍රීක හෙලනිස්ටික කලාව.




**වීනස් දී මීලෝ,** ඇලෙක්සැන්ඩ්‍රොස් ශිල්පියා, ග්‍රීක හෙලනිස්ටික කලාව.



**ලැඔකූන්,** ග්‍රීක හෙලනිස්ටික කලාව.



**කවපෙත්ත විසිකරන්නා,** මයිරන් ශිල්පියා, ග්‍රීක සම්භාව්‍ය කලාව.



**හර්මීස් සහ ඩයෝනීසස්,** ප්‍රැක්සිටෙලස් ශිල්පියා, ග්‍රීක සම්භාව්‍ය කලාව.





**ඇතීනා දෙවඟන,** පීඩියස් ශිල්පියා, ග්‍රීක සම්භාව්‍ය කලාව.



**පූජක රුව,** මොහෙන්ජෝදාරෝ, සුදු හුණුගල් මාධ්‍යය.



**රතු වැලිගලින් කළ කවන්ධ රුව,** ඉන්දු නිම්න ශිෂ්ටාචාරය.



**නළඟන,** හරප්පා, ලෝකඩ මාධ්‍යය.




අලු වැලිගලින් කළ කවන්ධ රුව, හරප්පා, ඉන්දු නිම්න ශිෂ්ටාචාරය.




පශුපති (ශිව) මුද්‍රාව, හරප්පා, ඉන්දු නිම්න ශිෂ්ටාචාරය.



මොල්ලිය සහිත ගවරුව මුද්‍රාව, ඉන්දු නිම්න ශිෂ්ටාචාරය.



ජයග්‍රාහීව ජෙරුසලමට පිටත් වීම, ඩේවිඩ් පේන්ටර් ශිල්පියා, ක්‍රිස්තියානි තේමා දේශීය පරිසරය තුළින් නිරූපණය කිරීම, කැන්වසය මත තෙල්සායම්.



යහපත් සමරිතානුවරයා, ඩේවිඩ් පේන්ටර් ශිල්පියා, ත්‍රිත්ව දෙව් මැඳුර.



අගස්තියර් සහ විනයාගර්, පෙරියතම්බි සුබ්‍රමනියම් ශිල්පියා, ඉනුවිල් පරරාසසේකර පිල්ලේයාර් කෝවිල.



ඇතා වල්ලිව එළවාගෙන යාම, පෙරියතම්බි සුබ්‍රමනියම් ශිල්පියා, ඉනුවිල් පරරාසසේකර පිල්ලේයාර් කෝවිල.



සුදු කුකුළාගේ රුව, තාවඩි මු තුරෙයිසාමි ශිල්පියා, සට්ටනාදර් ශිව දේවාලයේ තිබූ සිතුවමකි.



සුදු අත් සහිත පූජක රුව සහ ගණපති රූපය, තාවඩි මු තුරෙයිසාමි, සට්ටනාදර් ශිව දේවාලය.



දඹුල්ල ලෙන් විහාර සංකීර්ණය, ලෙන් විහාර පහකින් සමන්විතය, ක්‍රි. ව. 1 වන සියවසට අයත් ය. මහනුවර සම්ප්‍රදායේ සිතුවම් සහිතය.



අනෝතප්ත විල, දඹුල්ල විහාරය



දහසක් බුදුවරු, දඹුල්ල විහාරය



බුද්ධත්වයෙන් පස්වන සතිය (මාර දූවරු පරාජය කිරීම), දඹුල්ල විහාරය




මාරපරාජය, දඹුල්ල විහාරය



දේව ප්‍රතිමා (සුමන සමන් දෙවි) සහ බුදු පිළිම නිර්මාණ, දඹුල්ල විහාරය



විරැකියාව, ඒ. සී. ජී. එස්. අමරසේකර ශිල්පියා, ලංකා කලා සංගමය



යකැදුරාගේ දියණිය, ඒ. සී. ජී. එස්. අමරසේකර ශිල්පියා, ලංකා කලා සංගමය



ගඩලාදෙණිය, ජී. එස්. ප්‍රනාන්දු ශිල්පියා, කඩදාසි මත දියසායම්.




උළු පෝරණුව, ජී. එස්. ප්‍රනාන්දු ශිල්පියා, කඩදාසි මත දියසායම්.



පෙරහැර, ස්ටැන්ලි අබේසිංහ ශිල්පියා, 20 වන සියවසේ ශ්‍රී ලංකාවේ නූතනවාදී කලාව.



කුඹල් හල, ස්ටැන්ලි අබේසිංහ ශිල්පියා, 20 වන සියවසේ ශ්‍රී ලංකාවේ නූතනවාදී කලාව.





**සිරිබිරිස්,** කැමිලස් පෙරේරා ශිල්පියා, ශ්‍රී ලංකාවේ කාටූන් කලාව



**ගජමෑන්,** කැමිලස් පෙරේරා ශිල්පියා, ශ්‍රී ලංකාවේ කාටූන් කලාව



**අප්පුහාමි,** ජෙෆ්රී යූනුස් ශිල්පියා, ශ්‍රී ලංකාවේ කාටූන් කලාව




**අප්පුහාමි,** ජෙෆ්රී යූනුස් ශිල්පියා, ශ්‍රී ලංකාවේ කාටූන් කලාව



**පුංචි සිංඤෝ,** ඩබ්. ආර්. විජේසෝම ශිල්පියා, ශ්‍රී ලංකාවේ කාටූන් කලාව





**පුංචි සිංඤෝ,** ඩබ්. ආර්. විජේසෝම ශිල්පියා, ශ්‍රී ලංකාවේ කාටූන් කලාව



43 කණ්ඩායමේ සාමාජිකයෝ, ඔබ්රි කොලට් ශිල්පියා, ශ්‍රී ලංකාවේ කාටූන් කලාවේ පුරෝගාමී සලකුණ ඔබ්රි කොලට් ශිල්පියා ය.



ඔබ්රි කොලට් ශිල්පියා ඇඳි කාටූන් චරිත



සී. ශිවඥාන සුන්දරම් ශිල්පියා ඇඳි කාටූන් චරිත




සී. ශිවඥාන සුන්දරම් ශිල්පියා ඇඳි කාටූන් චරිත




විවිධ කාටූන් නිර්මාණ, ඩබ්. ආර්. විජේසෝම ශිල්පියා, ශ්‍රී ලංකාවේ කාටූන් කලාව.



ගුවර්නිකා, පැබ්ලෝ පිකාසෝ ශිල්පියා, ඝනිකවාදී කලාව, යුද්ධයේ ඇති බිහිසුණු බවේ තාත්වික ප්‍රකාශනය.



**අවිග්නොන්හී යුවතියෝ,** පැබ්ලෝ පිකාසෝ ශිල්පියා, ඝනිකවාදී කලාවේ මුල් නිර්මාණය වේ.



**අප්‍රිකානු වෙස් මුහුණක්,** අවිග්නොන්හි යුවතියෝ සිතුවමට ආභාසය වූ අප්‍රිකානු කලාව.



**සීගිරි සිතුවම්,** අනුරාධපුර යුගයේ සම්භාව්‍ය කලාව.



**සීගිරි සිතුවම්,** අනුරාධපුර යුගයේ සම්භාව්‍ය කලාව.



**සීගිරි සිතුවම්,** විජ්ජුලතා සහ මේඝලතා ලෙස ළළනාරූප දෙවර්ගයක් බව පරණවිතානයෝ දක්වති.



**සීගිරිය,** අනුරාධපුර යුගයට අයත් ය, ක්‍රි. ව. 5 වන සියවස, කාශ්‍යප රජු සීගිරිය ආලකමන්දාව සේ ඉදිකර එහි විසීය.



**සීගිරි සිතුවම්,** අනුරාධපුර යුගයේ සම්භාව්‍ය කලාව.



**සීගිරි සිතුවම්,** රේඛාවේ විවිධතා.



**සීගිරි සිතුවම්,** විවිධ ආභරණ.




**සීගිරි සිතුවම්,** මත්ස්‍ය උදරවන් අක්ෂි නිරූපණය.



**සීගිරි කැටපත් පවුර,** සීගිරි පර්වතයේ වාස්තු විද්‍යා අංග

**සීගිරි සිතුවම්,** මල් අතැති ළලනාවන් මල් පුබුදුවන ආකාරයෙන් සහ මල් ඉසින ආකාරයෙන් නිරූපණය කර ඇත.




**අවුකන බුද්ධ ප්‍රතිමාව,** අනුරාධපුර යුගය, ක්‍රි. ව. 5-8 සියවස, අමරාවතී කලා ලක්ෂණ ප්‍රකාශවේ.


**අවුකන බුද්ධ ප්‍රතිමාව,** සිරස්පත, දකුණතින් අභය මුද්‍රාව, චීවරයේ රිද්මයානුකූල රැළි සහ මහා පුරුෂ ලක්ෂණ හඳුනාගත හැක.



**පන්කුළිය බුද්ධ ප්‍රතිමාව,** අනුරාධපුර යුගය, ක්‍රි. ව. 5-6 සියවසට අයත්ය. ගුප්ත කලා ලක්ෂණ හඳුනාගත හැක.


**පන්කුළිය බුද්ධ ප්‍රතිමාව,** දකුණතින් අභය මුද්‍රාව සහ වමතින් කටකහස්ත මුද්‍රාව දක්වා ඇත.


**සමාධි බුද්ධ ප්‍රතිමාව,** අනුරාධපුර යුගය, ක්‍රි. ව. 4-5 සියවසට අයත්ය.


**සමාධි බුද්ධ ප්‍රතිමාව,** ධ්‍යාන මුද්‍රාව, ගුප්තකලා ලක්ෂණ සහ ආධ්‍යාත්මික ගුණය ප්‍රකාශවේ.


**තොලුවිල බුද්ධ ප්‍රතිමාව,** අනුරාධපුර යුගය, ක්‍රි. ව. 7 සියවසට අයත්ය, ගුප්ත කලා ලක්ෂණ ඇත.


**මිනිසා සහ අශ්ව හිස,** ඉසුරුමුණි කැටයම්, අනුරාධපුර යුගය, පල්ලව කලා ලක්ෂණ පිළිබිඹුවේ යැයි මතයකි.




**ඉසුරුමුණි විහාරය,** අනුරාධපුර යුගය, ක්‍රි. පූ. 3 සියවසේ දේවානම්පියතිස්ස රජු විසින් කරවා ඇත. අරිට්ඨ කුමරු ප්‍රධාන කුල දරුවන් පන්සියයක් පැවිදි බව ලබා වැඩ සිටීම සඳහා කළ ඉසරසමණ විහාරය බව සඳහන් වේ.



**ජල ක්‍රීඩා කරන ඇතුන්,** ඉසුරුමුණි කැටයම්, අනුරාධපුර යුගය, පල්ලව කැටයමක් වන මහාබලිපුරම්හි ආකාශගංගාවරෝහණ කැටයමට සමාන කලා ලක්ෂණ පෙන්වයි.



**පෙම්යුවල,** ඉසුරුමුණි කැටයම්, අනුරාධපුර යුගය, ගුප්ත කලා ලක්ෂණ පෙන්වයි.



**ජල ක්‍රීඩා කරන ඇතුන්,** ඇතුන්ගේ ක්‍රියාකාරී ඉරියව් හඳුනාගත හැක.



**රජ පවුල,** ඉසුරුමුණි කැටයම්, අනුරාධපුර යුගය, අර්ධ කවාකාර ගල් පුවරුවක මනා මානව රූ සම්පිණ්ඩනයකි.




**දේවාරාධනය,** පොලොන්නරු යුගය, තිවංක පිළිමගේ අන්තරාලයේ දක්නට ලැබෙන සිතුවමකි, ක්‍රි. ව. 12 සියවසේ 1 වන පරාක්‍රමබාහු රජු තිවංක පිළිමගේ ඉදිකර ඇත.



**බුදුන් සංකස්ස පුරට වැඩම කිරීම,** පොලොන්නරු යුගය, තිවංක පිළිමගේ ගර්භ ගෘහයේ දක්නට ලැබෙන සිතුවමකි, බුදුන්ගේ රුව විශාලව දක්වා ඇත.



**තේමිය ජාතකය,** පොලොන්නරු යුගය, තිවංක පිළිමගේ මණ්ඩපයේ දක්නට ලැබෙන සිතුවමකි.



**සැතපෙන බුද්ධ ප්‍රතිමාව,** පොලොන්නරු යුගය, ගල්විහාරය හෙවත් උත්තරාරාමයේ පූර්ණ උන්නත ආබද්ධ පිළිමයකි. ක්‍රි. ව. 12 වන සියවස.



**සමාධි බුද්ධ ප්‍රතිමාව,** පොලොන්නරු යුගය, පංච ධ්‍යානි බුදුවරු සංකල්පය නිරූපණය වන බවට මතයකි.



**සමාධි බුදු පිළිමය,** පොලොන්නරු යුගය, ගල්විහාරය, ද්විත්ව රැළි යෙදූ චීවරය හඳුනාගත හැක.



**විද්‍යාධර ගුහාවේ බුදු පිළිමය,** පොලොන්නරු යුගය, ගල්විහාරය.




**හිටි පිළිමය,** පොලොන්නරු යුගය, ගල්විහාරය, පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව නිරූපණය වේ, තිවංක ඉරියව්ව ය.





**පොත්ගුල් විහාර ප්‍රතිමාව,** පොලොන්නරු යුගය, ක්‍රි. ව. 11-12 සියවසට අයත් ය. තිවංක ඉරියව්වෙන් නිරූපිතය.



**පොත්ගුල් විහාර ප්‍රතිමාව,** යටිකය වසාගත් දෝතිය බඳ පටිය මඟින් ඉනට තද වීම නිසා උදරය ඉදිරියට නෙරූ අයුරින් දක්වා ඇත.



**නිශ්ශංකලතා මණ්ඩපය,** පොලොන්නරු යුගය, ක්‍රි. ව. 1187-1196 කාලයට අයත් ය, නිශ්ශංකමල්ල රජු විසින් ඉදිකර ඇත.





**නිශ්ශංකලතා මණ්ඩපය,** නෙලුම් දඬු හැඩැති කුලුණු සහ ප්‍රවේශ දොරටුව.




වටදාගෙය, පොලොන්නරු යුගය, නිශ්ශංකමල්ල රජු හෝ පරාක්‍රමබාහු රජුගේ ඉදිකිරීමක් ලෙස සැලැකේ. ක්‍රි. ව. 12 වන සියවස



වටදාගෙය, බිනර මල් රටාව යෙදූ මිටි බැම්ම.



වටදාගෙය, සමාධි බුදු පිළිම, අනුරාධපුර අවධියේ බුදු පිළිම වල කලා ලක්ෂණ පෙන්වයි.



වටදාගෙය, සඳකඩ පහණ, මුරගල, කොරවක් ගල, පියගැටපෙළ, කුලුණු ඇත.



වටදාගෙය ආකෘතිය, පොලොන්නරු කෞතුකාගාරය



ශිව දේවාලය අංක 01, පොලොන්නරු යුගය, දකුණු ඉන්දීය ගෘහනිර්මාණ කලාව, ක්‍රි. ව. 13 වන සියවස





ශිව දේවාලය අංක 01, බදාම භාවිත නොකර පුරුද්දන ලද පාෂාණ කුට්ටි සහ පැන්නුම් කුලුණු.



ශිව දේවාලය අංක 02, පොලොන්නරු යුගය, චෝල ගෘහනිර්මාණ කලා ලක්ෂණ, ක්‍රි. ව. 10 වන සියවස.



සුන්දරමූර්ති ස්වාමි, හින්දු ලෝකඩ ප්‍රතිමා කලාව.



ගණදෙවි ප්‍රතිමාව, හින්දු ලෝකඩ ප්‍රතිමා කලාව.



කාරයිකාල් අම්මයියාර්, හින්දු ලෝකඩ ප්‍රතිමා කලාව.



නටරාජ මූර්තිය, හින්දු ලෝකඩ ප්‍රතිමා කලාව.



පාර්වතී, හින්දු ලෝකඩ ප්‍රතිමාවකි.



**සිදුහත් උපත**, පහත රට විහාර සිතුවම් සම්ප්‍රදාය, කරගම්පිටිය සුබෝධාරාමය



**පෙළඹවීම**, පහත රට විහාර සිතුවම් සම්ප්‍රදාය, කරගම්පිටිය සුබෝධාරාමය



**මහධන සිටුවරයාගේ කතාව (සංගීතය සහ විනෝදය)**, පහත රට විහාර සිතුවම් සම්ප්‍රදාය, කතලුව පූර්වාරාමය



**සුතසෝම ජාතකය (රජ මැඳුරේ කාන්තාවෝ)**, පහත රට විහාර සිතුවම් සම්ප්‍රදාය, කතලුව පූර්වාරාමය




**වැතිර සටින රූපය**, වියුක්ත මූර්ති කලාව, හෙන්රි මුවර් ශිල්පියා.



**රජ පවුල**, වියුක්ත මූර්ති කලාව, හෙන්රි මුවර් ශිල්පියා.



**පාට්ටුත්තිරත්තාලේ**, සංනිදර්ශන සිතුවම් කලාව, වෛතීසවරම් සිවසුබ්‍රමනියම් ශිල්පියා.




**4 වන ශ්‍රේණියේ දෙමළ බස පොත්** පිටකවරය, සංනිදර්ශන සිතුවම් කලාව, වෛතීසවරම් සිවසුබ්‍රමනියම් ශිල්පියා.





**සරළ සහ වියුක්ත හැඩ තල යෙදු සිතුවම්**, සංනිදර්ශන සිතුවම් කලාව, සුමන දිසානායක ශිල්පියා.



**කුකුල් පොරය**, ශ්‍රී ලංකාවේ නූතන චිත්‍ර කලාව, කේ. කනකසබාපති ශිල්පියා. ඝනිකවාදී සිතුවම් කලාවේ අභාසය හඳුනාගත හැක.



**කියවන ළමයා**, ශ්‍රී ලංකාවේ නූතන චිත්‍ර කලාව, කේ. කනකසබාපති ශිල්පියා. ඝනිකවාදී හැඩතල භාවිතය.



**මිනිසා සහ බල්ලන්**, ශ්‍රී ලංකාවේ නූතන මූර්ති කලාව, ඒ. මාර්ක් ශිල්පියා. එක්කාසු කලාව



**සකුන්තලා**, ඒ. මාර්ක් ශිල්පියා.



**සඳපායා**, එච්. ඒ. කරුණාරත්න ශිල්පියා, වියුක්ත ප්‍රකාශනවාදී චිත්‍ර කලාව.



**නම් නොකළ**, එච්. ඒ. කරුණාරත්න ශිල්පියා, ඝනිකවාදය සහ එක්කාසු කලාවේ ලක්ෂණ.



**දුෂ්කරක්‍රියාව**, ශ්‍රී ලංකාවේ නූතන මූර්ති කලාව, තිස්ස රණසිංහ ශිල්පියා.



**කොළඹ රාජකීය විද්‍යාලයේ උන්නත කැටයම**, ශ්‍රී ලංකාවේ නූතන මූර්ති කලාව, තිස්ස රණසිංහ ශිල්පියා, ටෙරාකොටා මාධ්‍යයෙන් නිර්මාණය කර ඇත.



**බුදුන්වහන්සේ සංකස්ස පුරට වැඩම කිරීම**, සාංචි උතුරු තොරණ කැටයම්.




**සාංචි ස්තූපය**, ඉන්දීය කලාව, අශෝක රජු විසින් නිර්මාණය කරන ලද සාංචි ස්තූපය බුබ්බුලාකාර හැඩති ය. ගල් ගරාදි වැට, මේධිය, ප්‍රදක්ෂිණා පථය, හර්මිකාව, යූපය, ඡත්‍ර සහ තොරණ යන සුවිශේෂ අංග ඇත.




**සාංචි උතුරු තොරණ**, ඉන්දීය කලාව, තොරණෙහි උඩලිපත් ලෙස හඳුන්වන තිරස් ගල් පුවරු ත්‍රිත්වයකි. එහි කෙළවර තල් පතක් හැකිලුවා මෙන් ය. සාලහංජිකා නම් යක්ෂණී රූව වාස්තු විද්‍යාත්මක උපක්‍රමයකි.



**ෂද්දන්ත ජාතකය**, සාංචි උතුරු තොරණ, අඛණ්ඩ කථන ක්‍රමය, තාත්වික සත්ව රූප මටසිලිටි හා සියුම් නිමාවෙන් යුක්තය, අල්ප උන්නත ක්‍රමයට නිර්මාණය කර ඇත.




සාංචි ස්තූපය හා එහි ප්‍රධාන අංග, ඉන්දියානු කලාව, අශෝක අවධිය.



ත්‍රිශූලය සහිත ඵලකය



සිංහ රූප



තිරස් ගල් පුවරු කෙළවර තල්පතක් ලෙස හකුළා ඇති ආකාරය (උඩලිපත් කෙළවර)



ඇත් රූප සහ සාලභංජිකා රූප




සිරස් ගල් කණු

තිරස් ගල් පුවරු (උඩලිපත්)



සාරානාත් බුදු පිළිමය, ඉන්දියානු කලාව, ගුප්ත යුගය.



**අජන්තා ගුහා පිහිටීම**, ඉන්දියානු කලාව. ගුහා 29 කි.



**අජන්තා ගුහා පිහිටීම**, වඝෝරා ගඟ අසබඩ අශ්ව ලාඩමක හැඩයට උස් පර්වතයක අජන්තා ලෙන් සමූහය පිහිටා ඇත. එහි සිතුවම් ගුප්ත කලා ලක්ෂණ පෙන්වයි.



**බුදුන් වහන්සේ කිඹුල්වත් පුරට වැඩම කිරීම**, අජන්තා ලෙන් 17 න් හමුවේ.



**පද්මපානි බෝසත් රුව**, අජන්තා ලෙන් 01 න් හමුවේ. ගුප්ත කලා ලක්ෂණ පෙන්වයි.



**පද්මපානි බෝසත් රුව**, තිවංක හැඩයෙන් යුක්තය. දකුණතින් නිල් මහනෙල් මලක් දරා සිටී. ආධ්‍යාත්මික හැඟීම් ප්‍රකාශ වේ. වර්ණ ගැන්වීමේ දී බෝසත් රුව දීප්තිමත් වර්ණයෙන් දක්වා ඇත.



**අප්සරා රූප**, කර්ණාභරණ, ග්‍රීවාභරණ, දිගු නෙත් සහ මද සිනහව දක්නට ලැබේ.

**අප්සරා රූප**, අංක 17 ලෙනෙන් හමුවේ. වියළි බදාම මත අඳිනු ලැබූ සිතුවම් ය. අප්සරා රූප ශ්‍රී ලංකාවේ සීගිරි සිතුවම් හි ලළනා රූප වලට සමාන ය.



# චිත්‍ර කලා පාරිභාෂික වචන මාලාව

**පසුගිය අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාග ප්‍රශ්න ආශ්‍රයෙනි**

1. **පර්යාවලෝකය** - කිසියම් චිත්‍රයක ඈත ළඟ පෙන්වීමේ සංකල්පයයි. (2010)
2. **වයනය** - වයනය යනු චිත්‍රයක ඇඳ ඇති වස්තූන් හෙවත් හැඩතලවල මතුපිට ස්වභාවයයි.
3. **සන්නිදර්ශන චිත්‍ර** - ගද්‍ය හෝ පද්‍ය ලේඛනයක එහි අර්ථය මතු කිරීම සඳහා අඳින ලද සිතුවම් සන්නිදර්ශන චිත්‍ර වේ. කෙටිකතාවක, නවකතාවක, පද්‍ය පන්තියක, ළමාගීතයක හෝ කතාන්දරයක එහි ඇතුළාන්තය තීව්‍ර කිරීම සඳහා අඳින ලද නිදර්ශන චිත්‍රයකි. (2011)
4. **මොනෝ ක්‍රෝම්** - එකම වර්ණයේ ප්‍රභේද භාවිතයෙන් අඳිනු ලබන චිත්‍ර මොනෝ ක්‍රෝම් ලෙස හඳුන්වයි. ඒකවර්ණ චිත්‍ර මොනෝ ක්‍රෝම් නම් වේ. (2014)
5. **සංගත වර්ණ** - සංගත වර්ණ යනු මිත්‍ර වර්ණ හෙවත් එකම පවුලේ වර්ණයන්ය. (2013), (2010)
6. **යටි පුවරුව** - චිත්‍ර ශිල්පය හදාරන ශිෂ්‍යයින් ප්‍රථමයෙන් රේඛා අධ්‍යයනය කිරීමට භාවිතා කළ පුවරුවයි. (2008)
7. **වකදෙක** - සිංහල සැරසිලි මෝස්තර කලාවේ මූලික අභ්‍යාසයකි. පැරණි ශිල්පියා තම ගෝලයාට ලබා දුන් මුල්ම රේඛා අභ්‍යාසය වකදෙක වේ. (2016)
8. **තිරිඟිතලය** - වකදෙක මත ගොඩනැගුණු සංකීර්ණ මෝස්තර අභ්‍යාසයකි.
9. **නිර්ජීවී මෝස්තර** - නිර්ජීවී යනු ජ්‍යාමිතික රේඛා හා හැඩතල ඇසුරින් නිර්මාණය කරන ලද මෝස්තරය. තිරස් රේඛා දෙකක් අතර ජ්‍යාමිතික හැඩ ඇසුරින් නිර්මාණය කරන ලද මෝස්තර ජ්‍යාමිතික මෝස්තර නම් වේ. අරිම්බුව, ගල්බිංදුව, පනාව, තනිපට ලණුව, දෙපට ලණුව උදාහරණ ලෙස ගත හැකිය. ඊ නිර්ජීවී මෝස්තර පාරම්පරික සිංහල සැරසිලි මෝස්තර හතරින් ප්‍රධාන ඒකකයකි. (2012)
10. **ගජසිංහ** - ඇත් හිසක් හා සිංහ ශරීරයකින් යුතු කල්පිත සත්ත්ව රුවකි. (2015)
11. **හර්මිකාව** - සාංචි ස්තූපයේ ධාතු ගර්භයට ඉහළින් පිහිටි වාස්තු විද්‍යාත්මක අංගයයි. මෙය ශ්‍රී ලංකාවේ ස්තූපවල හතරැස් කොටුව ලෙස හඳුන්වයි.
12. **මේධිය** - ලංකාවේ ස්තූපවල දැකිය හැකි පේසා වළලු ඉන්දියාවේ සාංචි ස්තූපයේ මේධි නමින් හැඳින්වේ. (2013)
13. **ගෝපුරම්** - හින්දු කොවිල්වල පිටත් බිත්තිවල දැකිය හැකි මූර්තිවලින් පිරි කොටසයි. (2017), (2010)
14. **කෝලම් රටා** - හින්දු බැතිමතුන් විසින් බිම සැරසිලි රටා නිර්මාණය කිරීම සඳහා යොදා ගනී. (2009)
15. **අල්පනාව** - උත්සව අවස්ථාවකදී සාම්ප්‍රදායිකව පොල්තෙල් පහනක් තබන ස්ථානය අලංකාර කිරීම සඳහා යොදනු ලබන සැරසිල්ලකි. (2011)
16. **රංජිත වීදුරු** - වර්ණවත් වීදුරු කැබලි ගැළපීමෙන් නිමවූ සිතුවම්ය. ගොතික් ක්‍රමයේ දේවස්ථානවල මෙම සිතුවම් දැකිය හැකිය. (2011)

17. **රාමසාන් (රාමලාන්)** - ඉස්ලාම් බැතිමතුන්ගේ ප්‍රධාන උත්සවයකි. (2011)

18. **මිනාර්/මිනරෙට්** - ඉස්ලාමීය පල්ලියක දක්නට ලැබෙන ගෘහ නිර්මාණ අංගයකි. ඉස්ලාමීය පල්ලියක දෙපස ඉදි කර ඇති කුළුණු මිනාර් හෙවත් මිනරෙට් නම් වේ. (2010), (2008)

19. **කුම්බා/කුෆා** - ඉස්ලාමීය ආගමික ගොඩනැගිලිවල වහලයේ ඇති ගෝලාකාර කොටසය. ඉස්ලාම් පල්ලිවල ශිඛරය හැඳින්වෙන නමකි.

20. **ශිඛරම් (ශිඛරය)** - හින්දු සහ ඉස්ලාමීය දේවස්ථාන මත ඉදි කර ඇති ගෝලාකාර පට්ටම් සහිත වාස්තු විද්‍යා අංගයයි. (2016)

21. **අක්ෂර චිත්‍ර/කැලිග්‍රැෆි/චාරුලේඛන** - ඉස්ලාමීය බැතිමතුන් විසින් අක්ෂර භාවිතයෙන් අඳිනු ලබන චිත්‍ර හෙවත් රූපාක්ෂර කැලිග්‍රැෆි හෙවත් අක්ෂර චිත්‍ර ලෙස හඳුන්වයි. මුස්ලිම් පල්ලිවල කුරානයේ ඇති පාඨ අරාබි බසින් විචිත්‍රවත් ලෙස විවිධ හැඩ මතුවන සේ අඳින කලාව කැලිග්‍රැෆි නම් වේ. (2012)

22. **සංඛ නිධි හා පද්ම නිධි** - අභයගිරි විහාර භූමියේ දක්නට ලැබෙන මුරගල් දෙකකි. එනම් සංඛයක් සහිත බහිරව රූපය හා පද්මයක් සහිත බහිරව රූපයයි. (2016)

23. **නියඳ** - දුම්බර කළාල නිපදවීම සඳහා නියඳ කෙඳි ලබා ගනී.(2013)

24. **පන්නම් කළාල** - ඉතා චාම්ව කළ මෝස්තර නොදැමූ දුම්බර කළාල විශේෂයකි. (2017), (2014)

25. **කුරුළු කළාල** - කුරුළු හැඩ සහිත දුම්බර පැදුරු විශේෂයකි. (2011)

26. **සකපෝරුව** - මැටි භාණ්ඩ නිර්මාණය කිරීමට යොදා ගන්නා උපකරණයකි. (2014)

27. **ඇල්ටමීරා** - ඇල්ටමීරා යනු ස්පාඤ්ඤයේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සිතුවම් දැක්වෙන ස්ථානයකි. (2012)

28. **කෝගුල්, පොන්ඩිගෝම්** - ස්පාඤ්ඤයේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සිතුවම් දැක්වෙන ස්ථානයන්ය.

29. **ලැස්කෝ** - ප්‍රංශයේ දක්නට ලැබෙන ප්‍රාග් ඓතිහාසික යුගයේ සිතුවම් ඇති ස්ථානයකි.

30. **ලාක්ෂා** - පාරම්පරික ජන කලා කර්මාන්තයකි.

31. **ඊ වඩුවා** - අතීතයේදී ලාක්ෂා කාර්මිකයා මෙනමින්ද හැඳින්වීය.

32. **හංගිඩි වසම** - මහනුවර යුගයේදී රාජකීය කාර්මික කාර්යාංශයේ යෙදුණු ලාක්ෂා ශිල්පීන් හඳුන්වා ඇත්තේ හංගිඩි වසම යනුවෙනි.

33. **ගණ කැපීම** - වෙස් මුහුණක් නිර්මාණය කිරීම සඳහා ලී කඳන් කපා පොතු ගසා කැබලිවලට කපා ගැනීම ගණ කැපීම නම් වේ.

34. **පායම් පෑහීම** - වෙස් මුහුණක් නිර්මාණය කිරීමේදී ලී කොටයේ ඇති ගැට සහිත තැන් කපා පැතලි හැඩයක් සකස් කර ගැනීම පායම් පෑහීම නම් වේ. (2018)

35. **කිරි හිඳවීම** - වෙස් මුහුණු නිර්මාණය කිරීම සඳහා සකස් කළ ලීයේ ඇති අධික කිරි ගතිය ඉවත් කිරීම කිරි හිඳවීම යනුවෙන් හැඳින්වේ.

36. **ලකුණු කැපීම** - වෙස් මුහුණක ඇස්, නාසය වැනි සියුම් අංග මතු කිරීමේ ක්‍රමයයි.

37. **අල්ලියාදු** - වෙස්මුහුණු කර්මාන්තයේදී වෙස් මුහුණු වර්ණගැන්වීමට ප්‍රථමව සුදු වර්ණය ආලේප කිරීම අල්ලියාදු නම් වේ.

38. **නියපොතු වැඩ** - ලාක්ෂා කර්මාන්තයේ සරසිලි කරන ප්‍රධාන ශිල්ප ක්‍රමයකි. නියපොත්ත ආධාරයෙන් ලාක්ෂා භාණ්ඩ සැරසිලි කිරීම නියපොතු වැඩ නමින් හඳුන්වයි.

39. **පට්ටල් වැඩ** - පට්ටලය ආධාරයෙන් ලාක්ෂා භාණ්ඩ නිර්මාණය කිරීම පට්ටල් වැඩ යනුවෙන් හඳුන්වයි.

40. **සාදිලිංගම්** - පැරණි සිත්තරුන් රතු වර්ණය සඳහා භාවිතා කළ ඛනිජ ද්‍රව්‍යයකි.

41. **ලැපිස් ලැසුලි** - දීප්තිමත් නිල් වර්ණය සාදා ගැනීම සඳහා ආනයනය කරන ලද පාෂාණ විශේෂයකි. (අල්ට්‍රා මැරීන් නිල්) (2009)

42. **වෘෂභ කුඤ්ඤරය** - මුහුණට මුහුණලා සිටින ඇතෙකුගේත් ගොනෙකුගේත් හිස් එකට සම්පිණ්ඩනය කොට නිර්මාණය කරන ලද නිර්මාණයකි.

43. **කිහිඹි මුහුණ** - විශාල කටක් හා රතු තොල් සහිත්ව නිර්මාණය වී ඇති සාම්ප්‍රදායික සැරසිලි මෝස්තරයකි.

44. **පංචනාරීඝටය** - කාන්තාවන් පස්දෙනෙකුගේ රූප කළයක හැඩයට සම්පිණ්ඩනය කොට කරන ලද නිර්මාණයකි.

45. **විශ්වකර්ම** - කලාවට අධිපති දෙවියන් ලෙස සැළකේ.

46. **ප්‍රෙස්කෝ සිකෝ** - වියළි බදාමය මත සිතුවම් ඇඳීමේ ශිල්ප ක්‍රමය මෙනමින් හඳුන්වයි.

47. **ප්‍රෙස්කෝ බුවනෝ** - තෙත බදාමය මත සිතුවම් අඳින ශිල්ප ක්‍රමය මෙනමින් හඳුන්වනු ලැබේ.

48. **ටෙම්පරා** - වියළි බදාමය මත බන්ධන මාධ්‍යයක් සමඟ මිශ්‍ර කර ගන්නා ලද වර්ණවලින් ඇඳීමේ ක්‍රමයයි. (2010)

49. **කියුරොස්කුරෝ** - චිත්‍රයක අඳුර තුළින් ආලෝකය වඩාත් මතු කිරීමේ වර්ණ ගැන්වීමේ ශිල්ප ක්‍රමයයි.

50. **පාර්ශ්වදර්ශී** - මානව රූප එක් පසකට පමණක් බලා සිටින සේ ඇඳීමය. මහනුවර යුගයේ උඩරට සම්ප්‍රදායට අයත් විහාර සිතුවම් රැසක් ඇඳ ඇත්තේ පාර්ශ්ව දර්ශී ක්‍රමයටය. (2018)

51. **අඛණ්ඩ කථන ක්‍රමය** - කථාව එක දිගට ගලා යන පරිදි ඇද දැක්වීමේ ක්‍රමයයි. මහනුවර යුගයේ විහාර සිතුවම්වල ජාතක කථා නිරූපණය කර ඇත්තේ මෙම ක්‍රමයටය. අවස්ථා ගණනාවක් එක් චිත්‍රයක් තුළ හෝ කැටයමක් තුළ දැක්වීම අඛණ්ඩ කථන මාධ්‍ය ලෙස හැඳින්වේ. (2013), (2008)

52. **මඩොල් කුරුපාව** - ඇම්බැක්කේ දේවාලයේ සුවිශේෂ වූ පියස්ස පරාල විසිහයක් එක් ලී ඇණයකට සම්බන්ධ කර ඇති අංගය මඩොල් කුරුපාව නම් වේ. (2008)

53. **වයිති/වලිත්ති** - දොරණ තෙල් හා හල්දුම්මල මුසුකරගත් ආලේපනයකි. (2009)

54. **සිරස්පත** - බුද්ධ ප්‍රතිමවල උෂ්ණීසය මත නිර්මාණය කළ අංගයකි. මහනුවර හා ගම්පොළ යුගයේ නිර්මාණය වූ බුදුපිළිමවල ශීර්ෂය මුදුනේ ඇති කොටස සිරස්පත යනුවෙන් හඳුන්වයි. (2018)

55. **හයිග්‍රෝලිපික්ස්** - මිසර කලාවේ අක්ෂර චිත්‍ර හෙවත් රූපාක්ෂර මෙනමින් හඳුන්වයි. (2012)

56. **අමර්ණා යුගය** - ඊජිප්තු කලාවේ නව රාජධානි යුගය මෙනමින් හඳුන්වයි. මිසර රාජධානි අතරින් එකකි. (2015)

57. **කා** - මිසර වැසියන් මරණින් මතු ආත්මය කා යනුවෙන් හැඳින්වීය.

58. **ටෙරාකොටා** - මැටියෙන් තනා පුළුස්සාගත් භාණ්ඩද ටෙරාකොටා වශයෙන් හඳුන්වයි. කොළඹ රාජකීය විදුහලේ නව රඟහලේ ටෙරාකොටා භාවිතයෙන් කළ කැටයමක් දැකිය හැකි වේ. (2015)

59. **ඔබ්රි කොලට්** - ශ්‍රී ලංකාවේ පුවත්පත් කාටූන් කලාවේ පුරෝගාමී ශිල්පියා වශයෙන් සැලකේ. (2014), (2008)

60. **ජෙෆ්රි යුනුස්** - ශ්‍රී ලංකාවේ විසූ පුවත්පත් කාටූන් ශිල්පියෙකි. අප්පුහාමි කාටූන් චරිතය නිර්මාණය කරන ලද්දේ ජෙෆ්රි යුනුස් විසින්ය. (2009)

61. **නිල් යුගය** - පැබ්ලෝ පිකාසෝ ශිල්පියාගේ චිත්‍ර ඇඳි අවධි තුනෙන් මුල් අවධිය නිල් යුගය (1901-1904) ලෙස හඳුන්වයි.

62. **රෝස යුගය** - පැබ්ලෝ පිකාසෝගේ චිත්‍ර නිර්මාණවල දෙවන අවධිය වේ (1905-1906).

63. **ඝනිකවාදී යුගය** - පැබ්ලෝ පිකාසෝගේ චිත්‍ර නිර්මාණවල තෙවන අවධිය වේ (1907න් පසු). ජ්‍යාමිතික හැඩතල භාවිතය, පැතලි වර්ණ භාවිතය හා බාහිර රේඛාකරණය ඝනිකවාදී සම්ප්‍රදායේ අගනා නිර්මාණ අතරට ගැනේ.

64. **පර්ජන්‍යය** - ඉසුරුමුණි කැටයමක් වන මිනිසා හා අශ්ව හිස කැටයමෙහි මිනිස් රුවෙන් වර්ෂාව ඇති කරවන පර්ජන්‍ය දෙවියන් සංකේතවත් වන බව මහාචාර්ය සෙනරත් පරණවිතාරණ මහතා පවසයි. (2018), (2013)

65. **විජ්ජුලතා** - සීගිරි බිතුසිතුවම්වල රන්වන් පැහැති කාන්තාවන්ගෙන් විජ්ජුලතා හෙවත් විදුලිය සංකේතවත් වන බව මහාචාර්ය සෙනරත් පරණවිතාරණයන් ප්‍රකාශ කර ඇත. (2012)

66. **ත්‍රිභංග තිවංක** - ඉණ, දෙදණ, බෙල්ල යන ශරීරාංග තුන් පැත්තකින් නැමුණු යන අදහස ත්‍රිභංග/ තිවංක යන නමින් හඳුන්වයි. උදා : පොළොන්නරුවේ තිවංක පිළිමගෙයි දේවාරාධනය නැමැති සිතුවමෙහි දේවරූප ත්‍රිභංග හැඩයෙන් යුක්ත වේ. අජන්තා ලෙනෙහි පද්මපාණී බෝසත් රුව තිවංක හැඩයෙන් යුක්තය. බොහෝ හින්දු ප්‍රතිමාද ත්‍රිභංග හැඩයෙන් යුත්කය. (2016), (2014)

67. **සාලභංජිකා** - සාංචි තොරණේ උඩෙලිපත් කෙළවර කැටයම් කර ඇති යක්ෂණී රූප සාලභංජිකා නම් වේ.

68. **උඩලිපත** - සාංචි තොරණේ හරස් අතට (තිරස් අතට) යොදා ඇති ගල් පුවරු උඩලිපත යනුවෙන් හැඳින්වේ. (2018), (2015)

69. **ක්ෂය වෘද්ධි ලක්ෂණ** - යම් වස්තුවක් ඉදිරියෙන් දැක්වීමේදී කෙටි වී පෙනීමයි. ඉසුරුමුණි විහාරයේ දිය කෙළින ඇත් රූපවල ක්ෂය වෘද්ධි ලක්ෂණ දැකිය හැකිය. (2009)

70. **ආකාශ ගංගාවරෝහණය** - ඉසුරුමුණියේ ඇතුන් දිය කෙළින කැටයමෙහි ඇත් රූප ඉන්දියාවේ පල්ලව කලා සම්ප්‍රදායට අයත් මහාබලිපුරම්හි ආකාශ ගංගාවරෝහණ කැටයමේ ඇත් රූපවලට සමාන ලක්ෂණ පෙන්වන බව විචාරක අදහස වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

1. සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව, (2014). චිත්‍ර කලාව ගුරු මාර්ගෝපදේශය 6 ශ්‍රේණිය, මහරගම: ජාතික අධ්‍යාපන ආයතනය.

2. සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව, (2016). චිත්‍ර කලාව ගුරු මාර්ගෝපදේශය 7 ශ්‍රේණිය, මහරගම: ජාතික අධ්‍යාපන ආයතනය.

3. සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව, (2016). චිත්‍ර කලාව ගුරු මාර්ගෝපදේශය 8 ශ්‍රේණිය, මහරගම: ජාතික අධ්‍යාපන ආයතනය.

4. සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව, (2017). චිත්‍ර කලාව ගුරු මාර්ගෝපදේශය 9 ශ්‍රේණිය, මහරගම: ජාතික අධ්‍යාපන ආයතනය.

5. සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව, (2014). චිත්‍ර කලාව ගුරු මාර්ගෝපදේශය 10 ශ්‍රේණිය, මහරගම: ජාතික අධ්‍යාපන ආයතනය.

6. සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව, (2015). චිත්‍ර කලාව ගුරු මාර්ගෝපදේශය 11 ශ්‍රේණිය, මහරගම: ජාතික අධ්‍යාපන ආයතනය.

OL/2018/43-S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**43 S I**

| පත්‍රය | ලකුණු |
|---|---|
| I | |
| II | |
| III | |
| එකතුව | |
| පරීක්ෂක 1 | |
| පරීක්ෂක 2 | |
| ගණිත පරීක්ෂක | |

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2018**

**2018.12.11 / 0830 - 0930**


චිත්‍ර I
சித்திரம் I
Art I

පැය එකයි
ஒரு மணித்தியாலம்
*One hour*

※ **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

**විභාග අංකය** :.......................................

● පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.



**1.** මෙම වාස්තු විද්‍යා නිර්මාණය .................................................... විහාර භූමියේ පිහිටා ඇත.

**2.** මෙය ............................................. යුගයේ බුවනෙකබාහු රජ සමයේ ඉදිකරන ලදි.

**3.** මෙම අපූර්ව නිර්මාණය .......................................... නමින් හැඳින්වේ.

**4.** මෙය ද්‍රවිඩ වාස්තු විද්‍යා ශිල්පාචාරීවරයකු වූ .................................................... ශිල්පියා විසින් නිම කරන ලද්දකි.

**5.** සතර දිසාවට මුහුණලා ඇති අයුරින් තනා ඇති .................................................... සතර මත පරිවාර චෛත්‍ය සතරක් ඉදිකර ඇත.

[දෙවැනි පිටුව බලන්න.

- අංක **6** සිට **10** තෙක් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

**6.** බටහිර ස්වාභාවිකවාදී චිත්‍ර ශෛලීය ආභාසය අනුව නූතන විහාර සිතුවම් ඇඳීමේ පුරෝගාමී ශිල්පියා කවු ද?

..........................................................................................................................

**7.** A. මාර්ක් ශිල්පියා විසින් ඉවතලන ද්‍රව්‍ය ඇසුරෙන් නිර්මාණය කරන ලද මූර්තිය කුමන නමකින් හැඳින්වේ ද?

..........................................................................................................................

**8.** කාන්තා රූප යොදාගනිමින් කළයක හැඩයට අනුව සම්පිණ්ඩනය කර ඇති පාරම්පරික සැරසිලි මෝස්තරය කුමන නමකින් හැඳින්වේ ද?

..........................................................................................................................

**9.** 'පුංචි සිංඤෝ' නැමති කාටූන් චරිතය නිර්මාණය කළ ශිල්පියා කවු ද?

..........................................................................................................................

**10.** කුඩා හිස සහ සරල ව්‍යුක්ත හැඩ භාවිතයෙන් මූර්ති නිර්මාණය කළ යුරෝපීය මූර්ති ශිල්පියා කවු ද?

..........................................................................................................................

- අංක **11** සිට **15** තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා, ඊට යටින් ඉරක් අඳින්න.

**11.** 'ප්‍රෙස්කෝ සිකෝ' යනු,
(1) තෙත බදාමය මත ඇඳීමයි.
(2) හුණු මිශ්‍රිත බදාමය මත ඇඳීමයි.
(3) වියළි බදාමය මත ඇඳීමයි.
(4) බදාමය මත හුණු ආලේප කර ඇඳීමයි.

**12.** පිත්තල භාණ්ඩ නිර්මාණකරණයේදී විශේෂ වූ පොදුකාර්ය වනුයේ,
(1) වාත්තු කිරීම මගින් භාණ්ඩ නිර්මාණය කිරීමයි.
(2) තහඩු, කැටයම් කිරීමෙන් හා තැළීමෙන් භාණ්ඩ නිර්මාණය කිරීමයි.
(3) එබ්බවීම මගින් භාණ්ඩ සැරසිලි කිරීමයි.
(4) ඔප මට්ටම් කර දීප්තිමත්ව නිම කිරීමයි.

**13.** ඉන්දු නිම්න මූර්ති අතර තත්ත්වාකාර ස්වරූපයට වඩා ශෛලීගත ස්වරූපයක් දැක්වෙන මූර්තිය වනුයේ,
(1) පූජක රූව ය.
(2) නලඟන රූව ය.
(3) කවන්ධ රූව ය.
(4) නර්තන විලාසයක් දැක්වෙන කවන්ධ රූව ය.

**14.** මිසර කලා නිර්මාණ අතර හමුවන 'ස්පින්ක්ස්' රූව,
(1) මිසර වැසියන් ඇදහූ බලවත් දෙවියකුගේ පිළිරුවකි.
(2) පාරා රජෙකු නිරූපිත සුවිසල් මූර්තියකි.
(3) හුණු ගල් කුට්ටි භාවිතයෙන් ගොඩනැගූ මූර්තියකි.
(4) පාරාවරුන්ගේ තෙද බල මහිමය නිරූපිත කල්පිත මූර්තියකි.

**15.** ශ්‍රී ලංකාවේ ආදිවාසීන්ගේ ලෙන් සිතුවම්
(1) මානව හා සත්ත්ව රූ සංකේතවත්ව ඇඳ ඇත.
(2) සතුන්ගේ සැබෑ චලන ඉරියව් නිරූපණය කර ඇත.
(3) විසිතුරු වර්ණයන්ගෙන් අලංකාර කර ඇත.
(4) සත්ත්ව රූ නිරූපණයට පමණක් සීමා වී ඇත.

- අංක **16** සිට **20** තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍යය බැගින් ලියන්න.

**16.** පර්ජන්‍ය : ..........................................................................................


**17.** පායම් පැහීම : ..........................................................................................

**18.** පාර්ශවදර්ශී : ..........................................................................................

**19.** සිරස්පත : ..........................................................................................

**20.** උඩලිපත : ..........................................................................................


- අංක **21** සිට **25** තෙක් දී ඇති රූපසටහන්වලට කිසියම් සබඳතාවක් දක්වන රූපසටහන, ඉදිරියෙන් ඇති **A, B, C, D, E** යන ඒවා අතුරෙන් තෝරා, එහි අක්ෂරය **තිත් ඉර මත** ලියන්න.

**21.**  (.........)  **A**

**22.**  (.........)  **B**

**23.**  (.........)  **C**

**24.**  (.........)  **D**

**25.**  (.........)  **E**

- අංක **26** සිට **30** තෙක් දී ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචනය/වචන යොදා සම්පූර්ණ කරන්න.

**26.** අජන්තාවේ 17 වන ගුහාව තුළ දක්නට ඇති සීගිරි ලලනාවන් සිහිපත් කරවන රුව .......................... නමින් හැඳින්වේ.

**27.** මහධන සිටුවරයාගේ නිවසේ පැවති නැටුම් හා ගැයුම් සංදර්ශනය නිරූපිත සිතුවම පහතරට .......................... විහාරස්ථානය තුළ දක්නට ඇත.

**28.** ග්‍රීක දාර්ශනිකයන්ගේ ක්‍රියාකාරී ඉරියව් නිරූපණය කරමින් සම්පිණ්ඩනය කර ඇති රෆායල්ගේ සිතුවම .................................................... නමින් හැඳින්වේ.


**29.** ඉනුවිල් පරරාසසේකර පිල්ලෙයාර් කෝවිලෙහි දක්නට ලැබෙන, හින්දු සාහිත්‍යයේ එන කතාපුවත් රැසක් ....................................... ශිල්පියා විසින් සිතුවමට නගා ඇත.


**30.** ඊජිප්තු කලා නිර්මාණවල ඇකිය හැකි සාම්ප්‍රදායික ලක්ෂණවලින් මිදී නිර්මාණය වී ඇති නව රාජධානි යුගයේ හමුවන කාන්තා මූර්තිය ........................................... නමින් හැඳින්වේ.

- අංක **31** සිට **35** තෙක් දී ඇති ප්‍රශ්නවලට **F, G, H, I, J** යන රූපසටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.


F


G


H


I


J

**31.** **F** අක්ෂරයෙන් දැක්වෙන ශිව දෙවියන්ගේ පතිනිය වන 'ශිව කාමසුන්දරී' වඩාත් ප්‍රචලිත වන්නේ ................................ නමිනි.

**32.** **G** අක්ෂරයෙන් දැක්වෙන පිළිරුව පොළොන්නරුවේ ................................. භූමියේ දක්නට ඇත.

**33.** **H** අක්ෂරයෙන් දැක්වෙන ......................... පිළිරුව ෆීඩියස් විසින් නිර්මිත සුවිසල් මූර්තියකි.

**34.** **I** අක්ෂරයෙන් දැක්වෙන 'නම් නොකළ' යනුවෙන් නම් කර ඇති පිළිරුව ශ්‍රී ලාංකේය ශිල්පී ................................ ගේ නිර්මාණයකි.

**35.** **J** අක්ෂරයෙන් දැක්වෙන අනුරපුර යුගයේ දී 'මුරගල' සංකල්පය පරිණතියට පත්වූ අවස්ථාව නිරූපිත මෙම කැටයම ........................................................ ඉදිරියේ පිහිටා ඇත.

- ඔබ වෙත සපයා ඇති වර්ණ චිත්‍රය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක **36** සිට **40** තෙක් දී ඇති උපමාතෘකාවලට අදාළ ව අර්ථවත් වාක්‍ය **පහක්** ලියන්න.

**36.** ස්ථානය හා තේමාව : ..........................................................................................

..........................................................................................

**37.** ශිල්පියා : ..........................................................................................

..........................................................................................

**38.** සම්පිණ්ඩනය : ..........................................................................................

..........................................................................................

**39.** ආභාසය : ..........................................................................................

..........................................................................................

**40.** භාව ප්‍රකාශනය : ..........................................................................................

..........................................................................................

* * *

OL/2018/43-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

102293

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

43 I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2018

චිත්‍ර I / சித்திரம் I / Art I



* * *

OL/2019/43-S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**43 S I**

| පත්‍රය | ලකුණු |
|---|---|
| I | |

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

2019.12.10 / 0830 - 0930

චිත්‍ර I
சித்திரம் I
Art I


පැය එකයි
ஒரு மணித்தியாலம்
One hour

| | |
|---|---|
| පරීක්ෂක 1 | |
| පරීක්ෂක 2 | |
| ගණිත පරීක්ෂක | |

※ සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

විභාග අංකය :.....................................

● පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.



1. ක්‍රි.පූ. 3 සියවසේ දේවානම්පියතිස්ස රජු විසින් ඉදිකරන ලද මෙම විහාරස්ථානය .................................. විහාරය ලෙස හැඳින්වේ.

2. මෙම විහාරස්ථානය හා එහි දක්නට ඇති කැටයම් .................................... යුගයට අයත්වේ.

3. මෙහි දක්නට ලැබෙන හතරැස් පුවරු කැටයම වන .................................. කැටයමින් ගුප්ත කලා ලක්ෂණ නිරූපණය වෙතැයි සැලකේ.

4. මෙහි පිහිටි ගලේ නෙළන ලද කැටයම් අතර දියකෙළින ඇතුන් හා ..................................කැටයම විශිෂ්ට නිර්මාණයෝ ය.

5. මෙම කැටයම් කෙරෙහි ගුප්ත කලා ලක්ෂණ මෙන්ම .................................... කලා ලක්ෂණ දක්නට ඇතැයි සැලකේ.

[දෙවැනි පිටුව බලන්න.

- අංක **6** සිට **10** තෙක් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

**6.** සේනාධිලංකාර ඇමතිගේ උපදෙස් මත, ගම්පල ලංකාතිලක විහාරය ඉදිකරන ලද වාස්තුවිද්‍යා ශිල්පියා කවුද?

.......................................................................................................................

**7.** කේ. කනකසභාපති ශිල්පියා විසින් සිත්තම් කළ "කුකුල් පොරය" නම් සිතුවමෙහි කුමන කලා ලක්ෂණ නිරූපිත ද?

.......................................................................................................................

**8.** 43 කණ්ඩායමේ ශිල්පීන් නිරූපනය වන පරිදි නිමකර ඇති කාටූන් සිත්තම කාගේ නිර්මාණයක් ද?

.......................................................................................................................

**9.** ශ්‍රී ලාංකික සමාජ පසුබිම නිරූපනය වන පරිදි කිතු දහමේ සිද්ධි සිතුවම් කර ඇත්තේ මහනුවර කුමන දෙව් මැදුරේ ද?

.......................................................................................................................

**10.** මැදමහනුවර සම්ප්‍රදායට අයත් සිතුවම් දක්නට ඇති මැදවල විහාරය කුමන විහාර ඝනයට අයත් ද?

.......................................................................................................................

- අංක **11** සිට **15** තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා, ඊට යටින් ඉරක් අඳින්න.

**11.** අනුරපුර අභයගිරි විහාර භූමියේ දක්නට ඇති සමාධි පිළිමය,
(1) ක්‍රි.ව. 7 වැනි සියවසේ දී නෙළන ලද්දකි.
(2) ධ්‍යාන මුද්‍රාවෙන් හා වීරාසන ක්‍රමයෙන් යුක්ත ය.
(3) රැලි සහිත චීවරය ඇඟට ඇලුනු ස්වභාවක් ගනී.
(4) අමරාවතී සම්ප්‍රදායේ කලා ලක්ෂණ අනුව නෙළා ඇත.

**12.** පොළොන්නරුවේ අංක 2 ශිවදේවාලය,
(1) දකුණු ඉංදීය පාණ්ඩ්‍ය ගෘහ නිර්මාණ ලක්ෂණ අනුව ඉදිවූවකි.
(2) 13 සියවසට අයත් ඉපැරණිම දේවාලයයි.
(3) රාජරාජ රජුගේ මෙහෙසිය සිහිවීම පිණිස ඉදිකරන ලද්දකි.
(4) රාජේන්ද්‍රචෝල විසින් තම ජයග්‍රහන සිහිවීම පිණිස ඉදිකරන ලදී.

**13.** ලියනාඩෝ ඩාවින්චිගේ 'පර්වත මස්තකයේ දේව මැණියෝ' නම් වූ සිතුවම දක්නට ලැබෙනුයේ,
(1) ශාන්ත මරියා ඩෙලා ග්‍රෙසි තාපසාරාමයේ ය.
(2) සිස්ටයින් දෙව් මැදුරේ ය.
(3) ලන්ඩන් ජාතික කෞතුකාගාරයේ ය.
(4) ප්‍රංශයේ ලූවර් කෞතුකාගාරයේ ය.

**14.** 'ලැවොකුන්' නමැති මූර්තිය තුළින් නිරූපනය වනුයේ,
(1) හෙලනිස්ටික් යුගයේ කලා ලක්ෂණයි. (2) ග්‍රීක කලා කෘතිවල මූලික ලක්ෂණයි.
(3) සම්භාව්‍ය යුගයේ කලා ලක්ෂණයි. (4) ග්‍රීක යථාර්ථවාදී සම්ප්‍රදායේ ලක්ෂණයි.

**15.** පොළොන්නරුවේ ගල්විහාරය හෙවත් උත්තරාරාමය ලෙස හැඳින්වෙනුයේ,
(1) පල්ලව අභාසය මත ඉදිකරන ලද පිළිම ගෙයකි.
(2) සමාන ලක්ෂණවලින් යුතු පිළිම 4 ක් ඇති ස්ථානයකි.
(3) පැරකුම් රජදවස ගලින් කළ විහාර සංකීර්ණයකි.
(4) මහායාන බෞද්ධ සංකල්පය අනුව ඉදිකළ පටිමාඝරයකි.

- අංක **16** සිට **20** තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍යය බැගින් ලියන්න.

**16.** මිනාරට් : ..........................................................................................

**17.** තිරිඟි තලය : ..........................................................................................

**18.** පන්නම් කළාල : ..........................................................................................

**19.** ගෝපුර : ..........................................................................................

**20.** කෝන් ලාකඩ : ..........................................................................................

[තුන්වැනි පිටුව බලන්න.

- අංක **21** සිට **25** තෙක් දී ඇති රූපසටහන්වලට කිසියම් සබඳතාවක් දක්වන රූපසටහන, ඉදිරියෙන් ඇති **A, B, C, D, E** යන ඒවා අතුරෙන් තෝරා, එහි අක්ෂරය **තිත් ඉර මත** ලියන්න.

**21.**  (.........)  **A**

**22.**  (.........)  **B**

**23.**  (.........)  **C**

**24.**  (.........)  **D**

**25.**  (.........)  **E**

- අංක **26** සිට **30** තෙක් දී ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචනය/වචන යොදා සම්පූර්ණ කරන්න.

**26.** ශිව දෙවියන්ගේ මූලාදර්ශයක් සේ සැලකෙන 'අං සහිත දෙවියා' නිරූපිත මුද්‍රාව .......................... නමින් හැඳින්වේ.

**27.** නෙලුම් ශාකයේ අංග රිද්මානුකූලව යොදාගනිමින් පොළොන්නරු ශිල්පියා කළ අපූරු නිර්මාණය ................ .......................... තුළ දක්නට ඇත.

**28.** මහනුවර යුගයට අයත් දඹුලු විහාරයේ සිතුවම් ඇඳීමේ ගෞරවය .............................................. සිත්තර පරම්පරාවට හිමිවේ.

**29.** යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික සිතුවම් අතර අඩි 17 දිග ගවරුව .................................... ගුහාව තුළ දක්නට ඇත.

**30.** පොළොන්නරුවේ තිවංක පිළිමගෙයි ගර්භගෘහයේ සිතුවම් අතුරින් දේවාරාධනය හා .............................. .............................. යන සිතුවම් ඉපැරණි සිතුවම් සේ සැලකේ.

● අංක **31** සිට **35** තෙක් දී ඇති ප්‍රශ්නවලට **F, G, H, I, J** යන රූපසටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.


F


G


H


I


J

**31.** F අක්ෂරයෙන් දැක්වෙන හින්දු ආගමික ලෝහ මූර්තිය නිමවා ඇති ශිල්ප ක්‍රමය කුමක් ද?

..............................................................................................................

**32.** G අක්ෂරයෙන් දැක්වෙන ස්වභාවික ලක්ෂණ නිරූපිත ගන්ධාර පිළිමය කිනම් රජ දවස ඉදිකරන ලද්දක් ද?

..............................................................................................................

**33.** H අක්ෂරයෙන් දැක්වෙන දියසායම් මාධ්‍ය සිත්තම සිත්තම් කළ චිත්‍ර ශිල්පියා කවුද?

..............................................................................................................

**34.** I අක්ෂරයෙන් දැක්වෙන, ස්වාමියා කියන දේ ලියා ගැනීමට සැරසී සිටින අයෙකු නිරූපිත මිසර මූර්තිය නිමවා ඇති මාධ්‍ය කුමක් ද?

..............................................................................................................

**35.** J අක්ෂරයෙන් දැක්වෙන 'අප්සරා' නම් වූ අජන්තා සිතුවම චිත්‍රනය කර ඇති ශිල්ප ක්‍රමය කුමක් ද?

..............................................................................................................

● ඔබ වෙත සපයා ඇති වර්ණ චිත්‍රය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක **36** සිට **40** තෙක් දී ඇති උපමාතෘකාවලට අදාළ ව අර්ථවත් වාක්‍ය **පහක්** ලියන්න. (තනි වචනයෙන් පිළිතුරු සැපයීම ලකුණු නොලැබීමට හේතුවක් වනු ඇත.)

**36.** ශිල්පියා පිළිබඳව : ..............................................................................................................

..............................................................................................................

**37.** නිරූපිත තේමාව පිළිබඳව : ..............................................................................................................

..............................................................................................................

**38.** සංරචනය කර ඇති අයුරු : ..............................................................................................................

..............................................................................................................

**39.** ලබා ඇති ආභාස පිළිබඳව : ..............................................................................................................

..............................................................................................................

**40.** ප්‍රකාශිත හැඟීම් : ..............................................................................................................

..............................................................................................................

* * *


සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

43 I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

චිත්‍ර I / சித்திரம் I / Art I



* * *